**සමුපකාර අතිරික්ත අරමුදල - 2020**

**----------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**1.1 වියාචනය කළ මතය**

**------------------------**

සමුපකාර අතිරික්ත අරමුදලේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හේතුවෙන් අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය වියාචනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මා හට නොහැකි විය.

**1.2 වියාචනය කළ මතය සඳහා පදනම**

**------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය වියාචනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය වියාචනය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**------------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය වියාචනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය**

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

**1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද රු.4,757,296 ක් වූ ජංගම නොවන වත්කම් අරමුදල විසින් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණද ප්‍රමිත අංක 07 හි 65 ඡේදය ප්‍රකාරව වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය කර නොතිබුණු අතර ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ප්‍රමිත අංක 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | 2021 ජූලි 31 දින ප්‍රත්‍යාගණන කටයුතු අවසන් කර ගිණුම් නිවැරදි කල බව. | ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දේපල පිරියත හා උපකරණ අගය රු.13,163,369 ක් වූ අතර, අදාල විස්තර සටහන් 05 යටතේ දක්වා ඇති බව සඳහන් කර තිබුණ ද, ප්‍රමිත අංක 07 හි 86 ඡේදයේ දක්වා ඇති පරිදි අවශ්‍ය හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි. | 2021 ජූලි 31 දින ප්‍රත්‍යාගණන කටයුතු අවසන් වීමෙන් පසුව පිළියෙල කල උපලේඛනයේ වත්කම් වර්ගීකරණය කර නිවැරදිව ඉදිරිපත් කර ඇති බව. | ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කල යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අස්පෘශ්‍ය වත්කම් ලෙස පරිගණක මෘදුකාංග රු.189,001 ක් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර තිබුණද, එම මෘදුකාංග දැනට භාවිතයෙන් ඉවත් කර ඇති බැවින් එවැනි වත්කමක් භෞතිකව නොපැවතුණි. මෙම තත්ත්වය දිගින් දිගටම විගණන වාර්තා වලින් පෙන්වා දුන්නද සමාලෝචිත වර්ෂයේදී ද එය නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. | 2021 ජූලි 31 දින ප්‍රත්‍යාගණන කටයුතු අවසන් කර ගිණුම් නිවැරදිව කර ඇති බව. | භෞතිකව පවතින බවට සනාථ වන වත්කම් පමණක් මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් කල යුතුය. |
| (ආ) | ස්ථාවර වත්කම් ලේඛනයට අනුව දේපල පිරියත හා උපකරණ ශුද්ධ අගය රු.1,464,194 ක් වුවද, මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ එය රු.1,292,740 ක් ලෙස රු.171,454 ක් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදි කර ජ'නල් සටහන් ඇමුණුම් 04 මඟින් ඉදිරිපත් කල බව. | නිවැරදි වටිනාකම ගිණුම්වල දැක්වීමට කටයුතු කල යුතුය. |
| (ඇ) | ජාතික සමූපකාර සංවර්ධන ආයතනයට 2013 වර්ෂයේදී ලබා දී තිබූ රු. මිලියන 20 ක ණය ශේෂය 2015 සහ 2016 වර්ෂවලදී පියවා තිබුණද, 2017 වර්ෂයේදී ඉන් රු. 14,680,976 ක ශේෂයක් ණයගැතියන් ලෙස සටහන් වීමේ වරද නිවැරදි කිරීමට සමාලෝචිත වර්ෂයේ එම මුදල ආදායමට එරෙහිව කපා හැර තිබුණි. | 2019 වර්ෂය දක්වා සක්‍රීය ණය ලෙජරය හා උපලේඛනය අතර වෙනස්කම් නිරීක්ෂණය වූ අතර එය නිවැරදි කර 2018 වර්ෂයේ ගිණුම් නැවත ප්‍රකාශ කරන ලදී. ජාතික සමූපකාර සංවර්ධන ආයතනය වෙත 2013.12.06 දින ලබා දුන් ණය මුදල වන රුපියල් මිලියන 20 ක ණය මුදල පියවා අවසන් කර ඇති බවත් එය උපලේඛනයේ සටහන් වී ඇති වරද නිවැරදි කිරීමක් පමණක් සිදුකර ඇති බව. | වරද සිදු වූ වර්ෂය හඳුනාගෙන ඒ අනුව අදාල ගිණුම් වලට ගැලපීම් කිරීමට කටයුතු කල යුතුයි. |

### 1.5.4 අවිනිශ්චිත ගිණුම්

| විෂය | මුදල<br>රු. | අවිනිශ්චිත ලෙස තිබූ කාලය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| අවිනිශ්චිත ගිණුම | 9,475,735 | වර්ෂ 21 | දීර්ඝ කාලයක සිට පැවත එන මෙම වෙනස සම්බන්ධව ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ නිර්දේශ මත නිවැරදි කිරීමට කටයුතු කරන බව. | අවිනිශ්චිත ගිණුමේ ශේෂය හඳුනා ගෙන නිරවුල් කිරීමට කටයුතු කල යුතුයි. |

### 1.5.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විෂය | මුදල<br>රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) ලැබිය යුතු සමූපකාර සමිති ණය | 583,184,797 | ශේෂ සනාථන | ශේෂ සනාථන ලබාදෙන මෙන් සමුපකාර සමිති වෙත ඉල්ලීම් ලිපි ඉදිරිපත් කරන ලද බවත් එයට ප්‍රතිචාර දක්වා තිබුනේ සමිති 05 ක් පමණක් බව. | ශේෂ සනාථන ලබා ගැනීමට කටයුතු කල යුතුයි. |
| (ආ) සමූපකාර අරමුදලින් ලැබිය යුතු මුදල | 5,029,486 | ශේෂ සනාථන | ඉදිරියේදී ශේෂ සනාථන ලබාගෙන ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | -එම- |
| (ඇ) ලැබිය යුතු භාණ්ඩාගාර නියෝජ්‍ය ණය | 81,871,370 | ශේෂ සනාථන | මෙය තහවුරු කර ගැනීමට භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් වෙත ලිපියක් ඉදිරිපත් කරන ලද බව. | -එම- |
| (ඈ) ගෙවිය යුතු භාණ්ඩාගාර අරමුදල | 150,000 | ශේෂ සනාථන | අරමුදල් කමිටුවට ඉදිරිපත් කර නිර්දේශ ලබා ගැනීමට කටයුතු කරමින් පවතින බව. | -එම- |
| (ඉ) ගෙවිය යුතු ජාතික භාරකාර අරමුදල | 3,871,256 | ශේෂ සනාථන | අරමුදල් කමිටුවට ඉදිරිපත් කර නිර්දේශ ලබා ගැනීමට කටයුතු කරමින් පවතින බව. | -එම- |

| | | | | |
|---|---|---|---|---|
| (ඊ) පොදු තැන්පත් ගිණුම | 10,779,292 | විස්තරාත්මක උපලේඛන | කඩිනමින් ඉදිරිපත් කිරීමට නිලධාරීන්ට උපදෙස් ලබාදුන බව. | උපලේඛන ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතුයි. |
| (උ)ස්ථාවර තැන්පත් ඇප ණයහිමියෝ | 58,918,112 | ණය ලිපිගොනු සහ ශේෂ සනාථ කිරීම් | ප්‍රවර්ථන වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමින් පවතින බව. | ණය ලිපිගොනු හා ශේෂ සනාථන ඉදිරිපත් කිරීමට ක්‍රියාකල යුතුයි. |
| (ඌ) ඇවර ගිණුම් (හර ශේෂය) | 2,620,473 | පිළියෙල කරන ලද ඇවර ගිණුමේ පිටපත් | ප්‍රවර්ථන වර්ෂයේ ඉදිරිපත් කිරීමට නිලධාරීන්ට උපදෙස් ලබා තිබුණු බව. | ඇවර ගිණුමේ පිටපත් ඉදිරිපත් කල යුතුයි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.177,467,827 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.192,948,274 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.15,480,447 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට පොළී ආදායම රු.2,002,364 කින් අඩුවීම හා වෙනත් වියදම් රු.12,741,591 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සදහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විවිධ වත්කම් යටතේ දක්වා තිබුණු 1999 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එමින් පවතින රු.1,721,566 ක් වූ අහරු චෙක්පත් ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | දිගු කාලයක සිට පැවත එන මෙම ශේෂය කපා හැරීමට අමාත්‍යාංශ ලේකම් විසින් නිර්දේශ ඉදිරිපත් කර ඇති බැවින් ඉදිරියේදී එය නිරවුල් කරන බව. | අහරු චෙක්පත් ශේෂය නිරවුල් කිරීමට කටයුතු කල යුතුයි. |
| (ආ) | මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ විවිධ වගකීම් යටතේ දක්වා තිබු අතිරික්ත අරමුදලට ගෙවිය යුතු රු.6,017,551 ක් වූ ශේෂය 1987 වර්ෂයේ සිට නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | දිගුකාලයක සිට පැවතඑන මෙම ශේෂය කපා හැරීමට අමාත්‍යාංශ ලේකම්තුමා විසින් නිර්දේශ ඉදිරිපත් කර ඇත.ඒ අනුව ඉදිරියේදී එය නිරවුල් කරන බව. | ගෙවිය යුතු මුදල නිරවුල් කිරීමට ක්‍රියාකල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | ගෙවිය යුතු වගකීම් යටතේ එකතුව රු.734,392 ක් ලෙස දක්වා තිබුණු ඇවර සමිති අයවීම්, වැඩිපුර අයවීම්, සමූපකාර අරමුදල බස්නාහිර පලාත හා ගිණුම් මාරු යන ශේෂ දිගු කාලයක සිට නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | අරමුදල් කමිටුව වෙත ඉදිරිපත් කර නිරවුල් කිරීමට කටයුතු කරන බව. | -එම- |
| (ඉ) | 2020 ජනවාරි 01 දිනට ලැබිය යුතු රු.543,726,149 ක් වූ සක්‍රීය සමූපකාර සමිති ණය ශේෂයෙන් සමාලෝචිත වර්ෂයේදී අය වී තිබුණේ රු.22,611,959 ක් පමණි. ලැබිය යුතු රු.164,595,101 ක ණය පොලියෙන් සමාලෝචිත වර්ෂය තුල ලැබී තිබුණේ රු.2,089,268 ක් පමණි. | නිති අංශය වෙත ණය ලිපිගොනු 18 ක් භාර දී ඇති බවත් පළාත් සමූපකාර වල ණය අයකිරීම සඳහා එම පළාත් වලට ලබා දීමට කටයුතු කරන බව. | ූල් අයකර ගැනීමට පියවර ගත යුතුයි. |
| (i) | ඉහත ණය ශේෂ තුල ඇතුලත් සීමා සහිත කුරුණෑගල සමූපකාර ආරෝග්‍යශාලා සමිතිය වෙත නව ගොඩනැඟිලි සංකිර්ණයක් ඉදිකිරීම සඳහා 2012 වර්ෂයේ රු.මිලියන 100 ක ණය මුදලක් අරමුදලින් ලබා දී තිබුණ ද, සමාලෝචිත වර්ෂය අවසානයේදී එම ණය මුදලින් අය වී තිබුණේ රු.1,898,184 ක් පමණි. | ණය සඳහා පොලී සහනයක් ලබාදෙන ලෙස ඉල්ලීමක් කර ඇති අතර ණය ප්‍රතිලේඛනගත කිරීම සඳහා සාකච්ඡා පවත්වා ඇති බව. | -එම- |
| (ii) | වර්ෂ 6 කට අධික කාලයක සිට පැවත එන විවිධ සමූපකාර සමිති සහ සංගම් වලට ලබා දී තිබුණු රු.210,802,293 ක් වූ ණය මුදල හා ඒ සඳහා වූ රු.87,119,041 ක් වූ පොලියෙන් කිසිදු මුදලක් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටද කටයුතු කර නොතිබුණි. | අරමුදල් කළමනාකරණ කමිටු විසින් තීරණය කරන ලද පරිදි මෙම ණය ප්‍රතිලේඛනගත කිරීම හෝ ගිවිසුම් ප්‍රකාරව නෛතික ක්‍රියාමාර්ග ගැනීමට තීරණය කරන ලද බව. | -එම- |